සියලු ම හිමිකම් ඇවිරිණි.

SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර 02 විභාගය - 2026 ජූලි

## (2802) ඩිජිටල් පරිවර්තනය සහ තොරතුරු පද්ධති

(Digital Transformation & Information Systems)

2026-07-26
පෙරවරු
[8.45 – 12.00]

පිටු ගණන : 08
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  - (1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
    *උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*
  - (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  - (3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*
  - (4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  - (5) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  - (6) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 25)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** මිනිසුන් මෙන් සිතීමට සහ ක්‍රියාකිරීමට වැඩසටහන්ගත කර ඇති යන්ත්‍රවල මිනිස් බුද්ධිය අනුකරණය කිරීම හඳුන්වන්නේ:

(1) ගුටකදාම (Blockchain) ලෙසයි.

(2) කෘත්‍රිම බුද්ධිය (Artificial Intelligence) ලෙසයි.

(3) දත්ත දෘශ්‍යකරණය (Data Visualization) ලෙසයි.

(4) සමූහ අරමුදල් (Crowdfunding) ලෙසයි.

**1.2** පහත සඳහන් ඒවා අතුරෙන්, තොරතුරු පද්ධතිවල සදාචාරාත්මක භාවිතය ප්‍රවර්ධනය කිරීමේ ක්‍රමයක් වන්නේ කුමක් ද?

(1) විනිවිදභාවය (Transparency).

(2) උසස් ආරක්ෂක ක්‍රියාමාර්ග (Advanced Security Measures).

(3) නිතිපතා විගණන (Regular Audits).

(4) ඉහත සඳහන් සියල්ලම.

1.3 පහත සඳහන් විශ්ලේෂණ වර්ග අතුරෙන්, තත්‍යකාලීන රථවාහන ගමනාගමන සහ කාලගුණ දත්ත භාවිත කරමින් සැපයුම් සමාගමක් විසින් තම රියැදුරන්ට වඩාත් කාර්යක්ෂම බෙදාහැරීමේ මාර්ග නිර්දේශ කිරීම සඳහා භාවිත කරන්නේ කුමන විශ්ලේෂණ වර්ගය ද?

(1) විස්තරාත්මක (Descriptive) විශ්ලේෂණ.

(2) විනිශ්චය (Diagnostic) විශ්ලේෂණ.

(3) නිර්දේශාත්මක / වට්ටෝරු (Prescriptive) විශ්ලේෂණ.

(4) පුරෝකථන (Predictive) විශ්ලේෂණ.

1.4 පහත සඳහන් ඒවා අතුරෙන්, පොදු කාර්ය (අරමුණු) යෙදුම් මෘදුකාංග (general-purpose application software) සහ ව්‍යවසාය යෙදුම් මෘදුකාංග (enterprise application software) අතර වෙනස නිවැරදිව වෙන්කර දක්වන්නේ කුමකින් ද?

(1) පොදු කාර්ය යෙදුම් මෘදුකාංග, සංවිධානය පුරා ඒකාබද්ධතාවයට සහාය වන අතර, ව්‍යවසාය යෙදුම් මෘදුකාංග භාවිත කරන්නේ පුද්ගලයින් විසින් පමණි.

(2) ව්‍යවසාය යෙදුම් මෘදුකාංග මහා පරිමාණ ආයතනික ක්‍රියාවලීන් සඳහා සැලසුම් කර ඇති අතර, පොදු කාර්ය යෙදුම් මෘදුකාංග වචන සැකසුම් (word processing) සහ පැතුරුම්පත් (spreadsheets) වැනි පුළුල් පරාසයක පොදු කාර්යයන් ඉටු කරයි.

(3) පොදු කාර්ය යෙදුම් මෘදුකාංග භාවිත කළ හැක්කේ මාර්ගගතව (online) පමණක් වන අතර, ව්‍යවසාය යෙදුම් මෘදුකාංග මාර්ගගත සම්බන්ධයක් නොමැතිව (offline) පමණක් ක්‍රියා කරයි.

(4) ව්‍යවසාය යෙදුම් මෘදුකාංග, වෙනත් පද්ධති සමඟ ඒකාබද්ධ කිරීම අවශ්‍ය නොවන අතර, පොදු කාර්ය යෙදුම් මෘදුකාංග, ඒකාබද්ධ කිරීම අවශ්‍ය වේ.

1.5 මූල්‍ය සමාගමක සේවකයෙකු, එම සමාගමේ මූල්‍ය කළමනාකරුට අයත් පිවිසුම (login) භාවිත කර පද්ධතියට නීතිවිරෝධීව ප්‍රවේශ වී ඇති බව එම සමාගම සොයා ගන්නා ලදී. පහත සඳහන් නීතිවලින් කුමක් යටතේ ඔවුන්ට එම සේවකයාට එරෙහිව නඩු පැවරිය හැකිද?

(1) 2007 අංක 24 දරණ පරිගණක අපරාධ පනත.

(2) 2017 අංක 25 දරණ විද්‍යුත් ගනුදෙනු (සංශෝධන) පනත.

(3) 2024 අංක 09 දරණ මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත (Online Safety Act).

(4) 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත.

1.6 පහත සඳහන් ඒවා අතුරෙන්, ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍රකරණය [Business Process Outsourcing (BPO)] සන්දර්භය තුළ "ITES" යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

(1) ජාත්‍යන්තර තාක්ෂණ සක්‍රීය ආර්ථික සේවා (International Technology-enabled Economic Services).

(2) තොරතුරු තාක්ෂණ සක්‍රීය සේවා (Information Technology Enabled Services).

(3) ඒකාබද්ධ තාක්ෂණය සහ ඉංජිනේරු සහාය (Integrated Technology and Engineering Support).

(4) තොරතුරු සම්ප්‍රේෂණ සහ හුවමාරු පද්ධති (Information Transfer and Exchange Systems).

1.7 **නිමල්ට** ඔහුගේ බැංකුවෙන් සේ හැඟවෙන පරිදි හදිසි විද්‍යුත් තැපැල් පණිවිඩයක් ලැබුණු අතර, එහි ඇති සබැඳියක් (link) ක්ලික් (click) කර ඔහුගේ පිවිසුම් අක්තපත්‍ර (login credentials) සත්‍යාපනය (verify) කරන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටී. පහත දැක්වෙන සයිබර් ආරක්ෂණ තර්ජන (cybersecurity threats) අතුරෙන්, මෙම සිදුවීම විස්තර කරන්නේ කුමන සයිබර් ආරක්ෂණ තර්ජනයෙන්ද?

(1) රැන්සම්වෙයාර් (Ransomware).

(2) තතුබෑම් (Phishing).

(3) සේවා ප්‍රතික්ෂේප කිරීමේ [Denial of Service (DoS)] ප්‍රහාර (Attack).

(4) අභ්‍යන්තර තර්ජන (Insider Threats).

1.8 නිවසේ ලිපිනය සහ දුරකථන අංකය වැනි සංවේදී පුද්ගලික තොරතුරු අන්තර්ජාලයට කාන්දු වීම නිසා, පුද්ගලයෙකු ලුහු බැඳීම සහ ශාරීරික හානියකට ලක්වීමේ හැකියාවකට (stalking and potential physical harm) නිරාවරණය කරයි. පහත සඳහන් ඒවා අතුරෙන්, මෙම සිද්ධියේදී දුර්වල දත්ත පෞද්ගලිකත්වයේ (poor data privacy) බලපෑම වඩාත් හොඳින් නිරූපණය කරන්නේ කුමකින් ද?

(1) අනන්‍යතා සොරකම් කිරීම (Identity theft) සහ මූල්‍ය වංචාව.

(2) පෞද්ගලික ආරක්ෂාව (personal security) අහිමි වීම සහ ආරක්ෂණ අවදානම්.

(3) සීමිත ඩිජිටල් නිදහස (digital freedom) සහ පෞද්ගලිකත්වය උල්ලංඝනය කිරීම් (privacy violations).

(4) ව්‍යාපාර මෙහෙයුම් බාධා.

1.9 ශ්‍රී ලංකාවේ වෙළෙඳපොළට හඳුන්වා දී ඇති පහත සඳහන් බාධාකාරී තාක්ෂණයන් (disruptive technologies) සහ එම තාක්ෂණයන් සඳහා දී ඇති උදාහරණ සලකා බලන්න:

| **විස්තරය** | **උදාහරණය** |
|---|---|
| **(1)** ජංගම ගෙවීමේ වේදිකා (Mobile payment platforms). | **(a)** PickMe, HelaGo, Uber |
| **(2)** කුලී රථ වේදිකා (Ride-hailing platforms). | **(b)** eZ Cash, mCash, Frimi |
| **(3)** විද්‍යුත් වාණිජ වෙළෙඳපොළ ස්ථාන (E-commerce market places). | **(c)** Daraz, Kapruka |

ඉහත වගුවේ වම්පසින් දක්වා ඇති විස්තරයට අදාළ දකුණු පසින් පිළිවෙලින් සුදුසු උදාහරණයක් ලබාදී ඇත්තේ පහත සඳහන් ඒවා අතුරෙන් කවරකද?

(1) **(a), (b)** සහ **(c)**.

(2) **(a), (c)** සහ **(b)**.

(3) **(b), (a)** සහ **(c)**.

(4) **(c), (b)** සහ **(a)**.

1.10 රැකියා නියුක්තිය මත තොරතුරු පද්ධතිවල පහත බලපෑම් සලකා බලන්න:

**(a)** ස්වයංක්‍රීයකරණය (automation) හරහා නැවත නැවත කරන හස්තමය කාර්යයන් (repetitive manual tasks) ප්‍රතිස්ථාපනය (replacement) කිරීම.

**(b)** ඩිජිටල් වේදිකා හරහා කෙටි කාලීන නිදහස් වැඩවල (freelance work) වර්ධනය.

**(c)** රැකියා සුරක්ෂිතභාවය සහ දිගුකාලීන සේවකයින්ගේ ප්‍රතිලාභ සහතික කිරීම.

(d) දුරස්ථ වැඩ (remote work) සඳහා අවස්ථා වැඩි වීම.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, රැකියා නියුක්තිය මත තොරතුරු පද්ධතිවල නිවැරදි බලපෑම් වන්නේ:

(1) **(a)** සහ **(c)** පමණි.
(2) **(b)** සහ **(c)** පමණි.
(3) **(a), (b)** සහ **(d)** පමණි.
(4) ඉහත සඳහන් සියල්ලම.

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 20)

*අංක 1.11 සිට 1.15 දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ, ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.11** සුහුරු ජංගම දුරකතන (smartphones), ජංගම යෙදුම් හරහා සන්නිවේදන සහ පොදු අරමුණු කාර්යයන් සඳහා සහාය වෙමින් ඕනෑම වේලාවක ඕනෑම තැනක ඵලදායීතාවය වැඩිදියුණු කිරීමේ හැකියාව ලබාදේ.

**1.12** ව්‍යාපාර සම්පත් සැලසුම්කරණ [Enterprise Resource Planning (ERP)] පද්ධතියක් මඟින් කාර්යක්ෂමතාවය සහ දෙපාර්තමේන්තු පාලනය වැඩි කිරීම සඳහා වෙනම දත්ත සමුදායන් භාවිත කරමින් සංවිධානයක් තුළ පවතින එක් එක් දෙපාර්තමේන්තුවට ස්වාධීනව ක්‍රියාත්මක වීමට ඉඩ සලසයි.

**1.13** සයිබර් ප්‍රහාර වැළැක්වීමට අනුකූලතා රාමු (compliance frameworks) සඳහා නිතිපතා අවදානම් තක්සේරු කිරීම් අවශ්‍ය වේ.

**1.14** කොටස් මත පදනම් වූ සමූහ අරමුදල් (Equity-based crowdfunding) මඟින් දායකත්වය සපයන්නන්ට කිසිදු මූල්‍ය ප්‍රතිලාභයක් අපේක්ෂා නොකර සමාජ කටයුතු සඳහා මුදල් පරිත්‍යාග කිරීමට ඉඩ සලසයි.

**1.15** ශ්‍රී ලංකාවේ 2024 අංක 09 දරණ මාර්ගගත ආරක්ෂණ පනත මඟින් තහනම් ප්‍රකාශන අන්තර්ජාලය හරහා සන්නිවේදනය කිරීමෙන් සිදුවන හානිවලින් පුද්ගලයින් ආරක්ෂා කිරීම අරමුණ කෙරේ.

(එකකට ලකුණු 01 බැගින්, ලකුණු 05)
(මුළු ලකුණු 25)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 50)

### 02 වන ප්‍රශ්නය

**සුව ඔසු ඖෂධාලය,** කුඩා සිල්ලර ඖෂධාලයක් වන අතර, එය දැනට දෛනික විකුණුම්, සැපයුම්කරුවන්ගේ ඇණවුම් සහ ගනුදෙනුකරුවන්ගේ බෙහෙත් වට්ටෝරු, හස්තමය ලෙස (manually) පොත්වල සටහන් කරයි. නිරන්තරයෙන් සිදුවන තොග හිඟය, ප්‍රමාද වූ වාර්තාකරණය සහ ගනුදෙනුකරුවන්ගේ මිලදී ගැනීමේ ඉතිහාසය නිරීක්ෂණය කිරීමේ දුෂ්කරතා හේතුවෙන් ඖෂධාලයේ කළමනාකාරීත්වය පරිගණකගත තොරතුරු පද්ධතියක් (Computerized Information System) හඳුන්වාදීමට සැලසුම් කරයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) නව පද්ධතියක සාර්ථකත්වය සඳහා වඩාත් වැදගත් වන තොරතුරු පද්ධතියක මූලිකාංග (elements) දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04))

(b) **සුව ඔසු ඖෂධාලයේ** සමස්ත කාර්යසාධනය (overall performance) කෙරෙහි තොරතුරු පද්ධතියෙන් [Information System (IS)] සහ තොරතුරු තාක්ෂණයෙන් [Information Technology (IT)] වන බලපෑම් දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(c) **සුව ඔසු ඖෂධාලය** විසින් භාවිත කරනු ලබන ගුණාත්මක තොරතුරුවල ලක්ෂණ (characteristics) දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

**Silky Handloom** යනු මහනුවර පදනම් කරගත් කුඩා ශ්‍රී ලාංකික රෙදිපිළි ව්‍යාපාරයකි. එය තම ගනුදෙනුකරුවන්ගේ ඇණවුම්, සැපයුම්කරුවන්ගේ විස්තර සහ මූල්‍ය වාර්තා හස්තමය ලෙස (manually) කඩදාසි ලිපිගොනු සහ මූලික පැතුරුම්පත් (basic spreadsheets) භාවිතයෙන් කළමනාකරණය කරයි. ව්‍යාපාරික දත්ත කළමනාකරණය කිරීම සඳහා නිසි දත්ත සමුදාය පද්ධතියක් (database system) සැකසීමෙන් සහ එදිනෙදා මෙහෙයුම්වලට සහාය වීම සඳහා විශ්වාසදායක අන්තර්ජාල සම්බන්ධතාවයක් ලබා ගැනීමෙන් ව්‍යාපාරය ඩිජිටල් පරිවර්තනයකට ලක් කිරීමට එහි හිමිකරු වන **ගිහාන්**, තීරණය කර ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **Silky Handloom** ආයතනය සඳහා දත්ත සමුදායක් තෝරාගැනීමේදී සලකා බැලිය යුතු ප්‍රධාන සාධක (key factors) තුනක්(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(b) ආයතනයට අන්තර්ජාල සේවා සපයන්නෙකු [Internet Service Provider (ISP)] තෝරා ගැනීමේදී **ගිහාන්** විසින් සලකා බැලිය යුතු සාධක දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

විශාල නිෂ්පාදන සමාගමක්, නව තොරතුරු පද්ධති ක්‍රියාත්මක කිරීමෙන් තම මෙහෙයුම් නවීකරණය කිරීමට (modernize) සැලසුම් කරමින් සිටී. එමගින් තීරණ ගැනීම (decision-making) වැඩිදියුණු කිරීමට සහ එහි ව්‍යාපාර ක්‍රියාවලීන් බාහිර මූලාශ්‍රකරණය (outsource) කිරීමට කළමනාකාරීත්වය අදහස් කරයි. තවද, තරඟකාරී වාසියක් (competitive advantage) ලබාගැනීම සඳහා දත්ත විශ්ලේෂණ (data analytics) භාවිත කරන අතරම, ඇතැම් මූලික නොවන (non-core) ක්‍රියාකාරකම් බාහිරින් ලබාගැනීමටද සමාගම සැලසුම් කරයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) විධායක තොරතුරු පද්ධතියක [Executive Information System (EIS)] ලක්ෂණ (characteristics) සහ හැකියාවන් (capabilities) දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(b) විවිධ ප්‍රභේද කිහිපයකට අයත් වන දත්ත විශ්ලේෂණ මෙවලම් (data analytics tools) දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(c) ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍රකරණය [Business Process Outsourcing (BPO)] භාවිතයෙන්, සමාගම විසින් ලබාගන්නා වාසි හතරක්(04) **සඳහන් කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

ශ්‍රී ලංකාව තුළ වේගයෙන් ව්‍යාප්ත වන පෞද්ගලික සෞඛ්‍ය සේවා ආයතනයක් වන **MediTrust රෝහල,** ඉලෙක්ට්‍රොනික වෛද්‍ය වාර්තා (electronic medical records), රෝගීන් හමුවීම් සැලසුම් කිරීම, රසායනාගාර වාර්තා සහ ඩිජිටල් ගෙවීමේ සේවා කළමනාකරණය කිරීම සඳහා ඒකාබද්ධ මාර්ගගත රෝගී ද්වාරයක් (integrated online patient portal) ක්‍රියාත්මක කර ඇත. සෞඛ්‍ය සේවා මෙහෙයුම් ඩිජිටල්කරණය වැඩිවීමත් සමඟ, සංවේදී පුද්ගලික සහ වෛද්‍ය දත්ත සයිබර් ආරක්ෂක තර්ජනවලින් (cyber-security threats) ආරක්ෂා කිරීම, තොරතුරු පද්ධති වෙත අනවසරයෙන් ප්‍රවේශ වීම (unauthorized access) වැළැක්වීම සහ දේශීය සහ ජාත්‍යන්තර දත්ත ආරක්ෂණ රෙගුලාසිවලට අනුකූල වීම සහතික කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව කළමනාකාරීත්වය අවධානය යොමුකර තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **MediTrust රෝහලට** අදාලව දත්ත පෞද්ගලිකත්වයේ (data privacy) වැදගත්කම් හතරක්(04) **සඳහන් කරන්න.** (ලකුණු 04)

(b) සයිබර් ආරක්ෂණ අවදානම් අවම කිරීම සඳහා උපායමාර්ග ලෙස **MediTrust රෝහලට** ක්‍රියාත්මක කළ හැකි තාක්ෂණික පාලනයන් (Technical Controls) දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(c) 2022 අංක 09 දරණ පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතේ [Personal Data Protection Act (PDPA)] ප්‍රධාන විධිවිධාන / ප්‍රතිපාදන (key provisions) දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

**CeylonPay Solutions** යනු කොළඹ ප්‍රදේශය පාදක කරගත් ආරම්භක අවස්ථාවේ පවතින මූල්‍ය තාක්ෂණ (FinTech) සමාගමක් වන අතර, එය මෑතකදී ජංගම ගෙවීමේ වේදිකාවක් (mobile payment platform) දියත් කරන ලදී. එය සම්ප්‍රදායික බැංකු සේවා සඳහා සීමිත ප්‍රවේශයක් ඇති ග්‍රාමීය සහ අර්ධ නාගරික ශ්‍රී ලාංකිකයන් ඉලක්ක කරයි. මේවන විට සමාගම AI බලයෙන් ක්‍රියාත්මක වන චැට්බොට් මෙවලම් (chatbot tools) භාවිතයෙන් සිය සේවාවන් පුළුල් කිරීමට බලාපොරොත්තු වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) අළුතෙන් හඳුන්වා දුන් මෙම ජංගම ගෙවීමේ වේදිකාවෙන් **CeylonPay Solutions** හට ලබා ගතහැකි ප්‍රතිලාභ දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(b) නැගී එන තාක්ෂණයන් (emerging technologies) අනුගමනය කිරීමෙන්, **CeylonPay Solutions** ආයතනයට තරඟකාරී වාසියක් ලබාගත හැකි ආකාර දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(c) AI බලයෙන් ක්‍රියාත්මක වන Chatbot භාවිතයෙන් වඩාත් හොඳ සහ ඉතා නිවැරදි ප්‍රතිචාර ජනනය කිරීම සඳහා **CeylonPay Solutions** හි ගනුදෙනුකරුවන්ට භාවිත කළ හැකි කඩිනම් ඉංජිනේරු ශිල්පීය ක්‍රම (prompt engineering techniques) හතරක්(04) **සඳහන් කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 25)

## 07 වන ප්‍රශ්නය

**සීමාසහිත AgroLink (පෞද්ගලික) සමාගම,** යනු ශ්‍රී ලංකාවේ වේගයෙන් ව්‍යාප්ත වන කෘෂි තාක්ෂණ සමාගමක් වන අතර, එය ඩිජිටල් සැපයුම් වේදිකාවක් (digital supply platform) හරහා ග්‍රාමීය ගොවීන් සුපිරි වෙළෙඳසැල් සහ නාගරික සිල්ලර වෙළෙඳුන් සමඟ සෘජුවම සම්බන්ධ කරයි. වර්තමානයේ, සමාගමේ ප්‍රාදේශීය කාර්යාල, ස්වාධීන පද්ධති (standalone systems) මත ක්‍රියාත්මක වන අතර, සැපයුම් සේවා, මූල්‍ය සහ ප්‍රසම්පාදන දෙපාර්තමේන්තු අතර, සම්බන්ධීකරණය හස්තමය ක්‍රමයට සිදු කරයි.

ව්‍යාපාරයේ වර්ධනය හේතුවෙන්, **සීමාසහිත AgroLink (පෞද්ගලික) සමාගම** සැලසුම් කරනුයේ:

- මධ්‍යගත තොරතුරු තාක්ෂණ යටිතල පහසුකමක් (IT infrastructure) ස්ථාපිත කිරීම.
- සියළුම කළමනාකරණ මට්ටම් පුරා ඒකාබද්ධ තොරතුරු පද්ධති ක්‍රියාත්මක කිරීම.

- ගොවීන්ගේ වාර්තා, ඇණවුම්, මිලකරණය සහ බෙදාහැරීමේ කාල සටහන් කළමනාකරණය කිරීම සඳහා වලාකුළු පාදක (cloud-based) දත්ත සමුදායක් යොදා ගැනීම.
- ඉල්ලුම පුරෝකථනය කිරීම සහ මිලකරණ තීරණ සඳහා තත්‍යකාලීන විශ්ලේෂණ පුවරු (real-time analytics dashboards) හඳුන්වා දීම.
- දත්ත ආරක්ෂණ භාවිතයන් ශක්තිමත් කිරීම.
- තොරතුරු තාක්ෂණ භාවිතය වැඩිවීමෙන් සිදුවන පාරිසරික බලපෑම අඩු කිරීම.

කෙසේවෙතත්, කළමනාකාරිත්වය පහත සඳහන් කරුණු පිළිබඳව සැලකිල්ලක් යොමු කරයි:

- දත්තවල පෞද්ගලිකත්වය සහ ගොවීන්ගේ සහ සිල්ලර වෙළෙඳුන්ගේ තොරතුරුවල සදාචාරාත්මක භාවිතය.
- කුඩා පරිමාණ (small-scale) ග්‍රාමීය ගොවීන්, ඩිජිටල් කටයුතුවලින් බැහැර කිරීම.
- සේවාදායක පරිගණක (servers) සහ ජාලකරණ (networking) උපකරණවලින් විදුලි පරිභෝජනය ඉහළ යාම.
- ඇල්ගොරිතම මත පදනම් (algorithm-driven) වූ තීරණ මත අධික ලෙස යැපීම.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සීමාසහිත AgroLink (පෞද්ගලික) සමාගමෙහි** මධ්‍යගත ඩිජිටල් වේදිකාව (centralized digital platform) සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා සංවර්ධනය කළ යුතු හෝ ඉහළ දැමීම (upgrade) කළ යුතු ප්‍රධාන තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සංරචක දෙකක්(02) එක් සංරචකයක් සඳහා උදාහරණයක් සහිතව **සඳහන් කරන්න.** (ලකුණු 04)

(b) **සීමාසහිත AgroLink (පෞද්ගලික) සමාගමෙහි** එක් එක් කළමනාකරණ මට්ටම් (මෙහෙයුම්, උපක්‍රමික සහ උපායමාර්ගික) අනුව, එක් එක් මට්ටමේ භාවිත කරන තොරතුරු පද්ධති වර්ගයක් සහ එක් එක් කළමනාකරණ මට්ටම් ගනු ලබන තීරණ වර්ගයක් බැගින් **හඳුනා දක්වන්න.** (ලකුණු 06)

(c) ඩිජිටල් පරිවර්තන මුලපිරීම් (digital transformation initiatives) ආයතනික කාර්යක්ෂමතාවයට සහ නවෝත්පාදනයට (innovation) සැලකිය යුතු ලෙස බලපාන ආකාර දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

(d) **සීමාසහිත AgroLink (පෞද්ගලික) සමාගමේ** තොරතුරු පද්ධති භාවිතයට අදාලවන සදාචාරාත්මක ගැටළු දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(e) විද්‍යුත් අපද්‍රව්‍ය (e-waste) අඩුකර තොරතුරු තාක්ෂණ උපකරණවල ආයු කාලය වැඩි කළ හැකි තිරසාර භාවිතයන් තුනක්(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

| කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව | | | |
|---|---|---|---|
| **මට්ටම** | **ක්‍රියා ලැයිස්තුව** | **නිර්වචනය** | **සිසුන් සඳහා විස්තරාත්මක උපදෙස්** |
| **මතක තබා ගැනීම**<br>කරුණු,පද, මූලික සංකල්ප හෝ පිළිතුරු, ඒවායේ තේරුම නිසි ලෙස තේරුම් නොගෙන සිහිපත් කිරීම වේ | හඳුනා දක්වන්න | කෙනෙකුගේ හෝ යමක් හඳුනා දැක්වීම. | මාතෘකාවේ ප්‍රධාන කොටස් සොයා නම් කරන්න. |
| | නිර්වචනය කරන්න | වචනයක් හෝ සංකල්පයක් තේරුම් ගැනීම. | පදයක හෝ සංකල්පයක පැහැදිලි අර්ථයක් ලබා දීම. |
| | හඳුනා ගන්න | පෙර දැක නොමැති දෙයක් පිළිබඳ දැනුවත්භාවය. | පෙර ඉගෙනීම්වලින් යමක් සොය දැන ගැනීම. |
| | සඳහන් කරන්න | පැහැදිලි සහ සංක්ෂිප්ත ලෙස තොරතුරු ප්‍රකාශ කිරීම. | ප්‍රධාන කරුණු හෝ සංකල්ප සරල ආකාරයෙන් ප්‍රකාශ කිරීම. |
| | ලැයිස්තුගත කරන්න | නම්, සංඛ්‍යා හෝ අයිතම මාලාවක්. | ප්‍රධාන කරුණු සංවිධානාත්මකව ලිවීම. |
| | සටහන් කරන්න | පද්ධතියකට (ගිණුම්කරණය නොවේ) තොරතුරු ඇතුලත් කිරීම. | අදාල විස්තර පැහැදිලිව හා නිවැරදිව ඇතුලත් කිරීම. |
| **අවබෝධය**<br>තොරතුරුවල අර්ථය අවබෝධ කර ගැනීම සහ ඒවා අර්ථකථනය කිරීමට හෝ පැහැදිලි කිරීමට හැකිවීම. | ගොඩ නගන්න | මූලිකාංග ඒකාබද්ධ කිරීමෙන් යමක් ගොඩ නැගීම. | විවිධ කොටස් මගින් සමස්ථයක් ලෙස අර්ථවත් බවට පත් කිරීම. |
| | වෙනස් කොට දක්වන්න | දේවල් දෙකක් හෝ වැඩි ගණනක් අතර වෙනස්කම් හඳුනා ගැනීම. | සංකල්ප හෝ අයිතම අතර වෙනස්කම් අවධාරණය කිරීම. |
| | විමසන්න | මාතෘකාවක් පිළිබදව විවිධ අදහස් සහ මත සලකා බැලීම. | විවිධ දෘෂ්ටිකෝණ ගවේශණය කර අවබෝධයක් ලබා දීම. |
| | පැහැදිලි කරන්න | යමක් පිළිබඳව වඩාත් විස්තරාත්මකව පැහැදිලි කිරීම. | තාර්කික සහ සවිස්තරාත්මක මත විස්තරයක් සැපයීම. |
| | ගෙනහැර දක්වන්න | කරුණක් පැහැදිලි කිරීම සඳහා උදාහරණ, ප්‍රස්ථාර හෝ දෘශ්‍ය භාවිතය. | සුදුසු උදාහරණ හෝ දෘශ්‍ය මාධ්‍ය සමග පැහැදිලි කිරීම් සඳහා සහය වීම. |
| | අර්ථකථනය කරන්න | තොරතුරු හෝ ක්‍රියාවන්හි අර්ථය පැහැදිලි කිරීම. | යමකින් අදහස් වන්නේ කුමක්දැයි ඔබේ වචනවලින් පැහැදිලි කිරීම. |
| | විස්තර කරන්න | යම්කිසි දෙයක් පිළිබඳව සවිස්තරාත්මක විස්තරයක්. | අදාල විස්තර ව්‍යුහගත ආකාරයට සැපයීම. |
| | සාරාංශගත කරන්න | ප්‍රධාන කරුණු පිළිබඳව කෙටි ප්‍රකාශයක්. | සංක්ෂිප්තව ඉදිරිපත් කිරීම. |
| **භාවිතය**<br>අළුත් සහ සංකීර්ණ තත්වයන් යටතේ උගත් දැනුම භාවිතා කිරීම වන අතර මේ සඳහා දැනුම සහ කුසලතා ප්‍රායෝගිකව භාවිතා කිරීම අවශ්‍ය වේ. | භාවිත කරන්න. | යම්කිසි තත්වයන් තුළ දැනුම කුසලතා හෝ රීතීන් භාවිතා කිරීම. | ප්‍රතිඵල ලබාදීම සඳහා අදාල දැනුම හෝ ශිල්පීය ක්‍රම භාවිතා කිරීම. |
| | ගණනය කරන්න. | ගණිතමය හෝ තාර්කික ක්‍රම මගින් අගය තීරණය කිරීම. | විසඳුමක් ලබා ගැනීම සඳහා සංඛ්‍යාත්මක හෝ තාර්කික ක්‍රියාවලීන් පැහැදිලි කිරීම. |
| | තීරණය කරන්න | පර්යේෂණ හෝ ගණනය කිරීම් හරහා යමක් ස්ථාපිත කිරීම. | ගණනය කිරීමෙන් හෝ පර්යේෂණයකින් පසු යමක් සොයාගැනීම හෝ නිගමනය කිරීම. |
| | ප්‍රදර්ශනය කරන්න. | ක්‍රියාවලිය හෝ ක්‍රමය ප්‍රදර්ශනය කිරීම. | ව්‍යුහගත පියවර හරහා පැහැදිලි උදාහරණයක් පෙන්වීම. |
| | පිළියෙල කරන්න. | භාවිතය සඳහා ද්‍රව්‍ය හෝ තොරතුරු සංවිධානය කිරීම. | කාර්යයක යෙදීමට පෙර අවශ්‍ය විස්තර සකස් කිරීම. |
| | භාවිත කරන්න | සංකල්පයන් මෙවලමක් හෝ ක්‍රමයන් අරමුණක් සඳහා භාවිතා කිරීම. | අදාල දැනුම හෝ සම්පත් යෝග්‍ය පරිදි භාවිතා කිරීම. |
| | ඉදිරිපත් කරන්න. | සඵලදායී ලෙස තොරතුරු බෙදා ගැනීම. | මූලික දැනීම සහ අවබෝධයන් පැහැදිලිව සහ වෘත්තීමය වශයෙන් ඉදිරිපත් කිරීම. |
| **විශ්ලේෂණය**<br>ව්‍යුහය සහ සම්බන්ධතා අවබෝධ කරගැනීම සඳහා තොරතුරු කුඩා සංරචකවලට වෙන් කිරීම | විශ්ලේෂණය කරන්න | සංරචක අවබෝධ කරගැනීම සඳහා විස්තරාත්මකව පරීක්ෂා කිරීම. | වඩා හොඳ අවබෝධයක් සඳහා තොරතුරු ප්‍රධාන කොටස්වලට බෙදීම. |
| | සසඳන්න | සමානකම් සහ /හෝ වෙනස්කම් පරීක්ෂා කිරීම. | ප්‍රධාන පොදු ලක්ෂණ සහ වෙනස්කම් පෙන්වා දීම. |
| | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකින් වෙනස් කොට හඳුනා ගැනීම. | යමක් එකිනෙකට වෙනස් වන්නේ කුමකින්ද යන්න හඳුනා ගැනීම. |
| | පරීක්ෂා කරන්න | යමක ස්වභාවය තීරණය කිරීම සඳහා එය පරීක්ෂා කිරීම. | යමක් හොඳින් තේරුම් ගැනීම සඳහා එය හොඳින් නිරීක්ෂණය කිරීම. |
| | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. | ප්‍රධාන අංශ පිළිබඳව සංවිධානාත්මක දල විශ්ලේෂණයක් ලබා දීම. |
| | ක්‍රියා කරන්න | අත්හදා බැලීමක්, සමීක්ෂණයක් හෝ අධ්‍යනයක් සඳහා මූලිකාංග සංවිධානය කිරීම. | කාර්යයන් ක්‍රමානුකූලව සිදු කිරීම සඳහා ව්‍යුහාත්මක පියවර අනුගමනය කිරීම. |
| | වාර්තා කරන්න | සොයාගත් දෑ ව්‍යුහාත්මකව ඉදිරිපත් කිරීම. | විශ්ලේෂණය කළ තොරතුරු පැහැදිලි හා තාර්කික ආකෘතියකින් ඉදිරිපත් කිරීම. |
| **අගය කරන්න**<br>නිර්ණායක හෝ ප්‍රමිතීන් මත පදනම්ව අදහස් හෝ ද්‍රව්‍යයන් වල වටිනාකම හෝ ගුණාත්මක භාවය පිළිබදව විනිශ්චයන් සිදු කිරීම. | උපදෙස් දෙන්න | යෝජනා හෝ නිර්දේශ ඉදිරිපත් කිරීම | විශ්ලේෂණ මත පදනම්ව දැනුවත් මග පෙන්වීමක් ලබා දීම. |
| | අගය කරන්න | වටිනාකම් සඵලදායීතාවය හෝ බලපෑම පිළිබඳව විවේචනාත්මකව තක්සේරු කිරීම. | නිර්ණායක මත පදනම්ව යම් දෙයක ගුණාත්මකභාවය හෝ අදාලත්වය නිශ්චය කිරීම. |
| | සකස් කරන්න | ව්‍යුහගත ප්‍රවේශයන් හෝ සැලැස්මක් සංවර්ධනය කිරීම. | හොඳින් අර්ථ දක්වන ලද ක්‍රමෝපායන් හෝ උපාය මාර්ගයන් සකස් කිරීම. |
| | නිර්දේශ කරන්න | සුදුසු ක්‍රියාමාර්ග පිළිබඳ යෝජනා කිරීම. | තාර්කික කරුණු මගින් සහායවන ප්‍රවේශයන් යෝජනා කිරීම. |
| **නිර්මාණය කිරීම**<br>සුසංයෝගී හෝ ක්‍රියාකාරී සමස්තයක් සෑදීම සඳහා නව ආකාරවලින් මූලද්‍රව්‍ය ඒකාබද්ධ කිරීම නව අදහස්, නිෂ්පාදන හෝ අවබෝධ කර ගැනීමේ ක්‍රම ජනනය කිරීමේ හැකියාව | නිර්මාණය කරන්න | අළුත් දෙයක් නිර්මාණය කිරීම. | අපූර්ව සහ අරමුණු සහගත යමක් සංවර්ධනය කිරීම. |
| | තක්සේරු කරන්න | ගුණාත්මක භාවය, හැකියාව හෝ ස්වභාවය තක්සේරු කිරීම හෝ ඇගයීම. | පවතින තොරතුරු මත පදනම්ව තර්කානුකූල විනිශ්චයන් ලබා දීම. |
| | සංවර්ධනය කරන්න | අදහසක්, නිෂ්පාදනයක් හෝ සංකල්පයක් පුළුල් කිරීම හෝ වැඩිදියුණු කිරීම. | කාලයත් සමගින් අදහස ශක්තිමත් හා වැඩි දියුණු කිරීම. |
| | යෝජනා කරන්න | සලකා බැලීම සඳහා වන සැලැස්මක් හෝ සංකල්පයක් පිළිබඳ යෝජනා කිරීම. | අදහසක් හෝ ව්‍යුහගත නිර්දේශයක් ඉදිරිපත් කිරීම. |
| | සංයෝජනය කරන්න | විවිධ සංරචකයන්ගේ සංයෝජනය මගින් සංගත සමස්ථයක් නිර්මාණය කිරීම. | විවිධ අදහස් හෝ අවබෝධයන් අර්ථවත් වූ නිගමනයකට ඒකාබද්ධ කිරීම. |
| | සැලසුම් කරන්න | යමක් සඳහා ව්‍යුහගත සැලැස්මක් නිර්මාණය කිරීම. | නිෂ්පාදනයක් හෝ ක්‍රියාවලියක් සඳහා සවිස්තරාත්මක ව්‍යුහයන් සකස් කිරීම. |
| | ගොනු කරන්න | විවිධ මූලාශ්‍රයන්ගෙන් තොරතුරු එක් රැස් කිරීම. | එකතු කරන ලද දත්ත පුළුල් ආකෘතියකට සංවිධාන කිරීම. |